# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 233/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 09/02/2024

පැය 1130

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.02.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 08 | 07 | 458.75 | 1817.75 | ගෑස් ලිප් 01<br>ගෑස් සිලින්ඩර් 01<br>තඹ දඟර 02<br>යකඩ බැරල් 10 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2024.02.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගල්කිරියාගම පොලිස් වසමේ බඹරගස්වැව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිරියාගම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ බඹරගස්වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. ගල්කිරියාගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන** යනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුර.**

2024.02.09 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරුගම්බේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පොතුවිල් පොලිස් වසමේ ඌරණිය ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.02.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහකුඹුක්කඩවල පොලිස් වසමේ 06 කණුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් පස් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහකුඹුක්කඩවල පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වූ පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මහකුඹුක්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. සංරක්ෂිත සත්ත්වයෙකු වන කැස්බෑවකුගේ බිත්තර සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුර.**

2024.02.08 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කොස්ගොඩ පොලිස් වසමේ කොස්ගොඩ පාලම ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර සංරක්ෂිත සත්වයෙකු වන කැස්බෑවකුගේ බිත්තර 215 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කොස්ගොඩ පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වූ කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. කොස්ගොඩ** පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. නීති විරෝධි ලෙස වේ ගඟ ආශ්‍රිතව මැණික් ගරමින් සිටි සැකකරුවන් 25 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2024.02.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රත්නපුරය පොලිස් වසමේ මාරපන, උඩහවෙල කටුව ප්‍රදේශයේ දී වැටලීම් සිදු කර නීති විරෝධි ලෙස වේ ගඟ ආශ්‍රිතව මැණික් ගරමින් සිටි සැකකරුවන් 25 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ත් 54 ත් අතර වයස් වල පසුවන ඇල්පිටිගල, රත්නපුර, ජම්බුදෙනිය, පනුගල්පොත්ත, දැල, හා නිවිතිගල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.